# නිර්මාණාත්මක සන්නිවේදන මෙවලමක් වන කතන්දරය පවතින ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ ජීවන විලාසිතාව වඩාත් යහපත් කර ගැනීම සඳහා උත්තේජකයක් ලෙස භාවිත කිරීම.

*ඒ.එම්.ඩී.එස්. අලහකෝන්*[1]

නිර්මාණාත්මක සන්නිවේදනය වනාහි සන්නිවේදකයා සිය පණිවිඩය ග්‍රාහකයා වෙත වඩාත් සමීප කිරීම සඳහා අපූර්ව ලෙස යොදාගනු ලබන ක්‍රමෝපායකි. කතන්දරය එකී අපූර්ව ක්‍රමෝපායන් අතර ගාමක බලය ලෙස දැක්විය හැකි ය. එය මානව පැවැත්මේ ආරම්භයේ සිට ම විවිධ ආකාරයෙන් විකාශනය වෙමින් පුද්ගල ජීවනානුභූතීන් ගෙනහැර පෑමට සමත් සරල ආකර්ෂණීය සන්නිවේදන මාධ්‍යයකි. සමාජ මාධ්‍ය හා ජන මාධ්‍ය හරහා ලාංකේය අපට අත්දකින්නට ලැබෙන්නේ නූතන පරිභෝජනවාදී තරඟයට හසු වූ රටේ තරුණ තරුණියන්ගේ ජීවිත තත්ත්වය, සමාජ සම්බන්ධතා සහ හැසිරීම් දිනෙන් දින පිරිහෙමින් පවතින බවකි. එබැවින් අපගේ මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස ඒලෙස පිරිහෙමින් පවතින ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ ජීවන විලාසිතාව වඩාත් යහපත් කර ගැනීම සඳහා උත්තේජකයක් ලෙසින් නිර්මාණාත්මක සන්නිවේදන මෙවලමක් වන කතන්දරය භාවිත කිරීම කෙතරම් ඵලදායී ද යන්න ගවේෂණය කිරීම මූලික කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය, තරුණ තරුණියන් 500කට පවත්වන ලද ලෝක සෞඛ්‍ය සංවිධානයේ දින පහක මනෝහාරි චිත්තවේග කළමනාකරණය නේවාසික වැඩසටහනට සහභාගී වූ තරුණ තරුණියන් 40 දෙනෙකු මෙහි දී නියැදිය ලෙස තෝරාගත් අතර ගුණාත්මක පරීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය සිදු කෙරිණි. දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණය තෝරාගත් අතර දත්ත රැස්කිරීම, සහභාගිත්ව නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් හරහා මෙය සිදු කෙරිණි. කේතකරණය හරහා පළමු ව දත්ත වර්ගීකරණයට ලක් කරන ලද අතර, පසු ව එම වර්ගීකරණයන්ට අදාළ තේමා හඳුනා ගන්නා ලදී. හඳුනාගත් ප්‍රධාන තේමා ලෙස නිර්මාණාත්මක සන්නිවේදන මෙවලමක් වන කතන්දරය යොදාගැනීමෙන් පුද්ගල ජීවිතය විපර්යාසයට ලක් වීම, සමාජ සම්බන්ධතා යහපත් වීම සහ පුද්ගල ප්‍රජානන හැකියාව වර්ධනය වීම යන දෑ දැක්විය හැකි ය. පුද්ගල ජීවිතය විපර්යාසයට ලක් වීම යටතේ පුද්ගල ආකල්ප වර්ධනය වීම, පුද්ගල අත්දැකීම් පුළුල් වීම සහ පුද්ගල හැසිරීම් වඩාත් යහපත් වීම දැක්විය හැකි ය. සමාජ සම්බන්ධතා යහපත් වීම යටතේ අන්තර්පුද්ගල සබඳතා දියුණු වීම සහ සහකම්පනය දැක්විය හැකි අතර, පුද්ගලයාට වඩා පුළුල් වූ සිතීමක් අත්කර දීම, පුද්ගල ජීවිතය පිළිබඳ ඉගනුම ලැබීම සහ නිර්මාණශීලීත්වය පුද්ගල ප්‍රජානන හැකියාව වර්ධනය වීම යටතේ දැක්විය හැකි ය. මෙකී පර්යේෂණය හරහා දිනෙන් දින අගාධයට පත්වෙමින් තිබෙන තාරුණ්‍යයට මානවීය ජීවන මංපෙත් විවර කරදීමට කතන්දරය වඩාත් ඵලදායි ක්‍රමෝපායක් ලෙසින් යොදා ගන්නා ලදී. එබැවින් මිනිසාට තම ජීවන විලාසිතාව සාරවත් කර ගැනීම උදෙසා ඉගෙනුමක් සහ උත්තේජනයක් ලබා දීමට කතන්දරය භාවිත කිරීම වඩාත් යෝග්‍ය වූත් උචිත වූත් ක්‍රමෝපාය යි.

***ප්‍රමුඛ පදඃ*** නිර්මාණාත්මක සන්නිවේදනය, කතන්දරය, පුද්ගල ජීවන විලාසිතාව, උත්තේජකය

[1] ජනසන්නිවේදනය, මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. alahakoonsaumya@gmail.com